දේශපාලන

# විවරණ

2016 සැප්තැම්බර් - ඔක්තෝබර්

## අතුරුදහන් වූවන් පිළිබඳ පනතේ

# ඇත්ත කුමක්ද?

**ජනතා විමුක්ති පෙරමුණ**

**ගෞරවණීය ස්වාමීන්වහන්ස/පූජකතුමනි**
**ආදරණීය මව්වරුනි, පියවරුනි**
**සහෝදරය, සහෝදරිය**

පසුගිය කාලයේ පාර්ලිමේන්තුවේ සම්මත වූ පනත් අතරින් එකක් මහත් ආන්දෝලනයකට තුඩු දුන්නේය. ඒ, ඇතැමුන් විසින් රටේ ආරක්ෂක හමුදා දඩයම් කිරීමට ලක්කරන්නේය යන චෝදනාව එල්ල කළා වූද පාර්ලිමේන්තුවේ මහත් ගාලගෝට්ටි මැද විවාදයකින් තොරව සම්මත වූවා වූද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීම පිළිබඳ පනතයි. පාර්ලිමේන්තුව තුළ ප්‍රමාණවත් කතාබහකට ලක් නොවූ නිසාත් ජනමාධ්‍ය තුළ පනතේ අඩංගුව විවිධ වුවමනා එපාකම්වලට අනුව අර්ථකථනය වූ නිසාත් මෙම පනත පිළිබඳ ප්‍රමාණවත් සංවාදයක් සමාජය තුළ සිදු වූයේ නැත. එබැවින් මෙවර විවරණ කලාපය අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය හඳුනාගැනීම සඳහා වෙන්වෙයි.

## *OMP* යනු කුමක්ද?

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම) නමින් හඳුන්වනු ලැබූ පනත මගින් පිහිටුවනු ලබයි. එහි 10වැනි වගන්තිය මගින් ඒම කාර්යාලයේ (Office of Missing Persons - OMP) ප්‍රධාන කටයුතුවල සීමා රාමුව සලකුණු කර තිබේ. එනම්, (i) අතුරුදහන් වූවන් පිළිබඳ සොයාබැලීම හා ඔවුන් පිළිබඳව ලේඛන ගත කිරීම (ii)පුද්ගලයින් අතුරුදහන්වීම පිළිබඳ පසුබිම සොයාබැලීම හා ඔවුන්ට සිදුවූ දේ පිළිබඳ වාර්තා කිරීම (iii) අතුරුදහන්වීම් හා අතුරුදහන් කිරීම් අවම කරගැනීම සඳහා බලධාරීන් වෙත යෝජනා ලබාදීම (iv) අතුරුදහන්වීම්වලට ලක්වී ඇති අයගේ පවුල්වලට සහන ලබාදීමේ ක්‍රමවේදයක් හඳුනාගැනීම යන කරුණුය.

## *OMP*අවශ්‍ය ඇයි?

'අතුරුදහන් වූවන්' යන්න ලාංකේය සමාජයට නුපුරුදු යෙදුමක් නොවේ. ඉන් අදහස් වන්නේ කෙනෙකු තමා විසින් ස්වකැමැත්තෙන් පදිංචි ස්ථානයෙන් අතුරුදහන්වීමක් නොවන බවත් එය අතුරුදහන් වූ තැනැත්තාගේ කැමැත්තට පටහැණිව, බලහත්කාරයෙන් කරන ලද අතුරුදහන් කරවීමක් බව නොදන්නා අයෙකු නැත. ලංකේය සමාජය යුග ගණනාවක අතුරුදහන්වීම් පිළිබඳ අභිමිරි අත්දැකීම්වලින් බැටකනු ලැබ තිබේ. 1971 අප්‍රේල් නැගිටීම සමයේත් 1983 කළු ජූලිය තුළත් 1987-1990 ධවල භීෂණයේදීත් 2009න් අවසන් වූ යුද්ධයේ අවසන් වසරවලදීත්

2009-2015 කාලයේදීත් අතුරුදහන් කරවීම් පිළිබඳ සිදුවීම් වාර්තා වූ බව නොරහසකි. මෙම වකවානුවල සිදුවූ පැහැරගැනීම්, අතුරුදහන් කරවීම්වලට ලක්වූ අය සම්බන්ධයෙන් යුක්තිය ඉටුවීමක් සිදුනොවූ අතර ඔවුන්ගේ පවුල්වලටද සාධාරණයක් ඉටු නොවීය. අතුරුදහන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින්ට තම ඥාතියාට සිදුවූ දෙය ජීවත් වන තුරා ඇසට කඳුළු නංවන මතකයක් පමණකි. ඔවුන් වෙනුවෙන් සාධාරණ පිළිතුරක් ලබාදිය හැක්කේ නෛතික බලයක් ඇති ආයතනයකටය.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (ඕ.එම්.පී) පිහිටුවීමේ පනත මගින් ලංකේය ඉතිහාසයේ පළමු වරට රජයක් විසින් මෙරට තුළ අතුරුදහන් වූවන් පිළිබඳ සිදුවීම් ඇති බවද අතුරුදහන් වූවන්ගේ ඉරණම දැනගැනීමට ඥාතීන්ට අයිතියක් ඇති බවද නැවත මෙවැනි සිදුවීම් වැළැක්වීම සඳහා කාර්යාලයක් අවශ්‍ය බවද පිළිගෙන තිබේ.

## අතුරුදහන් වූවන් සහ ජ.වි.පෙ.

අතුරුදහන් කිරීම්වලට විවිධ කණ්ඩායම් ලක්වූ අතර 1971දීත් 1987-90 යුගයේදී රාජ්‍ය මර්දනයට තුළ අතුරුදහන්වීම්වලට ලක්වූයේ ජනතා විමුක්ති පෙරමුණයි. 1971දී දස දහසකට වැඩි ප්‍රමාණයකටද 80 දශකයේ අග භාගයේ 60,000කට අධික පිරිසකටද අත්වූයේ 'අතුරුදහන්වීමේ'ඉරණමය. ඔවුන් වෙනුවෙන් මරණ සහතික නොවීය; මිනීවළවල් හිමි නොවීය. ඔවුන්ගේ ඥාතීහු ඔවුනට සිදුවූයේ කුමක්දැයි නොදත්හ. ඔවුනට කිසිදා යුක්තියක් ඉටුවූයේ නැත. ඇතැම්විට අතුරුදහන් වූවන් පිළිබඳ ගොඩනැගුණු කථිකාව හුදු මැතිවරණ ප්‍රචාරක කටයුත්තක් වූවා පමණි; බලය තහවුරු කරගැනීමට අදාළ මෙහෙයුමක් වූවා පමණි. 1978 බලයට පත් එ.ජා.ප.ය 1971 සිදුවීම්වලට අදාළ ශ්‍රීල.නි.ප. සමගි පෙරමුණු ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ පරීක්ෂණ කොමිසමක් ස්ථාපිත කළේය. ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජිකයෝ එයට සාක්ෂි ඉදිරිපත් කළහ. අනතුරුව 1994 පොදුජන එක්සත් පෙරමුණු ආණ්ඩුව විසින් 86-90 එ.ජා.ප. පාලන කාලයේ අතුරුදහන් කිරීම් පිළිබඳව පත්කරන ලද අතුරුදහන්වූවන් පිළිබඳ ජනාධිපති කොමිසමටද ජ.වි.පෙ. විසින් සාක්ෂි ඉදිරිපත් කරන ලදී. එම කොමිසමට පමණක් අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි 33,000ක් ලැබී තිබිණි. කෙසේ වුවද මෙම මෙම කොමිෂන් සභා කිසිදු ප්‍රතිඵලයක් අත්කර නොදී 'අතුරුදහන්' වීමද විශේෂත්වයකි.

## අතුරුදහන්වීම් පිළිබඳ කොමිසම් - ජාත්‍යන්තර අත්දැකීම්

<u>ආර්ජන්ටිනාව:</u> 1976 -83 කාලයේ ආර්ජන්ටිනාවේ පැවති හමුදා ආඥාදායකත්වය යටතේ අතුරුදහන්වූවන්ගේ ඉරණම සොයාබැලීම

සඳහා 1983 දෙසැම්බරයේදී අතුරුදහන්වූවන් පිළිබඳ ජාතික කොමිසම (National Commission on the Disappearance of Persons) පිහිටුවනු ලැබිණි. එහි නිල වාර්තාව 1984 සැප්තැම්බරයේදී එළිදක්වන ලද අතර අදාළ කාලය තුළ පුද්ගලයින් 8,961ක් බලහත්කාරී ලෙස අතුරුදහන් කර ඇති බවට වාර්තා වූ නමුත් එහි සැබෑ සංඛ්‍යාව 30,000ක් තරම් ඉහළ අගයක් විය හැකි බව එම වාර්තාව ප්‍රකාශ කළේය.

<u>එල් සැල්වදෝරය:</u> වසර 12ක සිවිල් යුද්ධය තුළ සිදුවූ බලහත්කාරී අතුරුදහන්වීම් සහ අනීතික ඝාතන පිළිබඳ සොයාබැලීම සඳහා 1993දී එල් සැල්වදෝරයේ සත්‍ය කොමිසම (Truth Commission for El Salvador) ස්ථාපිත කරන ලදී. මෙම කොමිසම පිහිටුවන ලද්දේ FMLN වාමාංශික ගරිල්ලා කණ්ඩායම විසින් එක්සත් ජාතීන්ගේ මැදිහත්වීම යටතේ 1992දී අත්සන් තබන ලද සාම ගිවිසුමේ කොටසක් ලෙසය.

<u>දකුණු අප්‍රිකාව:</u> දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදී ප්‍රතිපත්තිය අවසන් වීමෙන් පසු 1994දී සත්‍ය සහ සංහිඳියා කොමිසම (Truth and Reconciliation Commission) පිහිටුවන ලදී. මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳව පැමිණිලි භාර ගන්නා ලද අතර වින්දිතයන්ට පැමිණිලි කිරීමට මෙන්ම චූදිතයන්ට පාපෝච්චාරණය කර සමාව ඉල්ලීමටද මෙහි අවස්ථාව සලසා දී තිබිණි.

## අතුරුදහන්වූවන් හා යුද්ධය පිළිබඳව ජ.වි.පෙ. ස්ථාවරය

යුද්ධය අවසානයේ නිසැක ලෙසම ඇතිවිය හැකි තත්වයන් පූර්වයෙන් දුටු ජනතා විමුක්ති පෙරමුණ යුද්ධය අවසන් වී සතියක් ඉක්මයාමට පෙර, 2009 මැයි 27වැනි දින 'හදිසි අභියෝග ජයගැනීම සඳහා වන ප්‍රායෝගික ප්‍රවේශයක්' නමින් යෝජනාවලියක් එවකට රාජපක්ෂ ආණ්ඩුවට භාර දීමට පියවර ගත්තේය. විවිධ ජන කොටස්වලට සිදුව ඇති අසාධාරණයන් පිළිබඳව සොයා බැලීමත් විවිධ ජන කොටස් අතර පවතින හිත් බිඳීම්, විරසකයන් තුරන් කිරීමත් අරමුණු කරගත් සත්‍ය හා ජාතික ප්‍රතිසන්ධාන කොමිසමක් පිහිටුවිය යුතුයැයි ජ.වි.පෙ. යෝජනා කළේ එම යෝජනා 14න් එකක් ලෙසය. යුද්ධයෙන් පසු තමන්ට වූ අසාධාරණයන් ඉදිරිපත් කිරීමට සියලුම ජනතාවට පොදු මධ්‍යස්ථානයක් අවශ්‍යය යන්න ජ.වි.පෙ. අදහස විය. විශේෂයෙන් අතුරුදන් වූවන්ගේ ඥාතීන්ට හා පීඩාවට පත්වූවන්ට දුක්ගැනවිලි ඉදිරිපත් කළ හැකි ස්ථානයක් ලෙසටත් අනාගතයේ එබඳු සිදුවීම් වැළැක්වීමට යෝජනා ඉදිරිපත් කිරීමේ ස්ථානයක් ලෙසටත් මෙම සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසම යොදා ගත හැකිව තිබිණි.

එයින් මාස එක හමාරකට පමණ පසු ජූලි 14වැනි දින ජ.වි.පෙ. නැවතත් 'දෙමළ ජනයා මුහුණ දී ඇති දුෂ්කරතාවයන් හා ගැටලු අවම කිරීම සඳහා ප්‍රායෝගික මැදිහත්වීමක්'නමින් කරුණු ගණනාවකින් යුත් යෝජනාවලියක් ආණ්ඩුවට ඉදිරිපත් කළේය. මෙම යෝජනාවලින් ජ.වි.පෙ. අවධාරණය කළේ අතුරුදන් වූවන් පිළිබඳව සහ පීඩාවට පත්වූවන් පිළිබඳව කඩිනමින් මැදිහත්වීමේ අවශ්‍යතාවයය. කෙසේ වුවද යුද්ධයේ අවසානය, මැතිවරණ ජයග්‍රහණය කිරීම සඳහා යොදා ගැනීමේ පටු, අදූරදර්ශී චින්තනයක ගිලී සිටි රාජපක්ෂ පාලනයට මේ යෝජනා වැදගත් වූයේ නැත. පසුකාලීනව මෙම කරුණුද පදනම් කරගනිමින් රටට ජාත්‍යන්තර බලපෑම් එල්ලවීම තුළින් ප්‍රකට වූයේද රාජපක්ෂ පාලනයේ මුග්ධභාවයය.

එමෙන්ම 2015 මැතිවරණය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද 'හෘද සාක්ෂියේ සම්මුතිය' ජාතික වැඩපිළිවෙළ තුළද ජ.වි.පෙ. මෙහි අවශ්‍යතාව මතු කළේය. එහි 08වැනි පිටුවේ "උතුරේ පැවති 30 අවුරුදු යුද්ධයෙන් විවිධාකාරයෙන් පීඩාවට පත්වූ හා හානි සිදුවූ සැමට තම දුක්ගැනවිලි ඉදිරිපත් කිරීමටත් ඒවා පිළිබඳව සත්‍ය සොයා බලා පීඩාවට පත්වූවන්ට සහන ලබාදීමටත් ජාතික සමගිය ප්‍රවර්ධනය කිරීමේ සහ ප්‍රතිසන්ධානගත කිරීමේ පනතක් මගින් සත්‍ය විමර්ශන කොමිසමක් පත්කෙරේ" යනුවෙන් යෝජනා කරන ලද්දේ එබැවිනි.

රාජපක්ෂ පාලනයෙන් පසු බලයට පත් මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුවද යුද්ධයෙන් පීඩාවට පත්වූ ජනතාව වෙනුවෙන් සාධාරණත්වය ඉටුකිරීමටත් අතුරුදහන් වූවන් පිළිබඳ කරුණු සලකා බැලීමටත් විශේෂයෙන් ජාතිකත්වයන් අතර සංහිඳියාව ගොඩනැගීමටත් අසමත්ය. විවිධ ජාතික හා ජාත්‍යන්තර බලපෑම් මත දෝලනය වන හවුල් ආණ්ඩුවට මෙම කරුණු සම්බන්ධයෙන් වන තමන්ගේම වූ වැඩපිළිවෙළක් නැත. යුද්ධයෙන් පීඩාවට පත්වූ ජනතාවට සහ අතුරුදහන් වූවන්ට සාධාරණත්වය ඉටුකිරීම, ජාතිකත්වයන් අතර සංහිඳියාව වැනි ගැටලුවේ සියලු පැති ආවරණය කරගන්නා සමස්ත වැඩපිළිවෙළක් ආණ්ඩුව සතු නොවේ. ඔවුන් විසින් ඉදිරිපත් කර ඇත්තේ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයක් පමණි. එයට සත්‍ය සෙවීමේ කොමිසමක් ඇතුළත් නොවීම අඩුපාඩුවකි.

අප රට තුළ ජාතිවාදයන්ටද පසුව රට බෙදන යුද්ධයකටද පාර කැපුණේ ලාංකේය ජනතාව තුළ පැවති (පවතින) ජාතික අසමගිය හේතුවෙනි. මෙම අසමගියේ හිඩැස් දේශීය ධනපති කණ්ඩායම් විසින්ද විදේශීය අධිරාජ්‍යවාදී හා බලවත් රටවල් විසින්ද ජනතාවන් අතර

අසමගිය තවත් වැඩිකරන දිශාවට භාවිත කළ අතරම විශේෂයෙන් විදේශීය අධිරාජ්‍යවාදී හා බලවත් රටවල් විසින් මෙම ගැටුම් හා යුද්ධය අප රටට දේශපාලන වශයෙන් අතපෙවීමට භාවිත කරන ලදී.

ඔවුහු ඒ සඳහා අපේ රටේ පාලකයින්ගේ ප්‍රජාතන්ත්‍රවිරෝධී පාලනයන්, මර්දන නීති, අධිකරණය දේශපාලන අතකොළුවක් කිරීම, මාධ්‍ය මර්දනය, අතුරුදහන් කිරීම් ආදී සියලුම කරුණු යොදා ගත්හ; එම ප්‍රජාතන්ත්‍රවිරෝධී තත්වයන් අධිරාජ්‍යවාදී නොවන රටවලටද ප්‍රචාරය කර හැරියහ; රතුපස්වල ඝාතන පිළිබඳ පරීක්ෂණ නොකරණ ශ්‍රී ලංකා ආණ්ඩුව යුද්ධය පිළිබඳ පරීක්ෂණ පවත්වන්නේ නැති බවටත් ශ්‍රී ලංකාවේ අග්‍රවිනිශ්චයකාරවරියට (ශිරාණි බණ්ඩාරනායක මහත්මියට) නොලැබෙන යුක්තිය, යුද්ධයෙන් පීඩාවට පත්වූ ජනයාට ලංකාවේ අධිකරණයෙන් නොලැබෙන බවටත් එම නිසා ජාත්‍යන්තර අධිකරණයක් අවශ්‍ය බවටත් ලොව පුරා මතයක් ඇති කළහ.

ජ.වි.පෙ. ස්ථාවරය වන්නේ, ජාත්‍යන්තර මැදිහත්වීම් එපා යන්නත් ශ්‍රී ලංකාවේ ජනයාට මානව හිමිකම් ලබාදිය යුතුය යන්නත් විදෙස් අධිකරණ එපා යන්නත් යුද්ධයෙන් පීඩාවට පත්වූ ජනතාවට, අතුරුදහන් වූවන්ට යුක්තිය ඉටුකළ යුතුය යන්නත්ය.

අධිරාජ්‍යවාදී මැදිහත්වීම් වැළැක්විය හැකි එකම මඟ මෙරට සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් හා මැලේ ජනතාවන්ට මානව අයිතීන්, අධිකරණයේ යුක්තිය, මාධ්‍ය නිදහස වැනි පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සහතික කිරීමය. සියලු ජාතිකත්වයන්ට අයත් ජනයාට ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් හා සමානාත්මතාව සහතික කිරීමය.

## *OMP* සහ ජ.වි.පෙ. මැදිහත්වීම හා සංශෝධන

ආණ්ඩුවේ පනත අඩුපාඩුකම් සහිත වුවද අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයක් ස්ථාපිත කළ යුතු බව ජ.වි.පෙ. ස්ථාවරය වේ. රාජ්‍ය මර්දනය තුළ අතුරුදහන්වීම්වලට, වධ හිංසනයන්ට ගොදුරු වූ පක්ෂයක් ලෙස, අනාගතයේ එවැනි දෑ ලාංකේය භූමිය මත සිදු නොවිය යුතු බව විශ්වාස කරන පක්ෂයක් ලෙස ජ.වි.පෙ. එවැනි මධ්‍යස්ථානයක අවශ්‍යතාව දැඩිව දකියි. ආණ්ඩුව විසින් පසුගිය මැයි 27වැනි දින ඕ.එම්.පී. පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාවේ ජ.වි.පෙ. විසින් එය පක්ෂය තුළ තුළ ගැඹුරෙන් සාකච්ඡා කරන ලද අතර නෛතික තත්වයන් සොයාබලනු ලැබීය. පනතේ ක්‍රියාවලියට ඍජුව අදාළ නොවන දේශීය හා විදේශීය වශයෙන් පටු දේශපාලන වුවමනාකම් වෙනුවෙන් යොදා ගත හැකි වගන්ති ඉවත්කර එම ඉඩකඩ අවුරාලීමට ජ.වි.පෙ. තීරණය කළේය.

ඒ අනුව ජ.වි.පෙ. විසින් පනතේ අදාළ කාර්යාලයට විදේශීය සංවිධාන සමග ගිවිසුම් ගතවීමට ඉඩ ලබාදුන් ප්‍රතිපාදනය (11-අ ඡේදය) සහ විදෙස් අරමුල් ලබාගැනීමට ඉඩ ලබාදුන් ප්‍රතිපාදනය (21 වගන්තිය) ඉවත් කිරීමටත් රාජ්‍ය ආයතනවලට වරෙන්තුවකින් තොරව ඇතුල්වී තොරතුරු ලබාගැනීමේදී පැය 24ක් ඇතුළත පොලිස්පතිට වාර්තා කළ යුතු බවට (12-ඊ ඡේදය) නව වගන්තියක් ඇතුළත් කිරීමටත් සංශෝධන ඉදිරිපත් කරන ලදී. ජ.වි.පෙ. විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනවලින් එකක් පාර්ලිමේන්තුවේ රාජපක්ෂවාදීන්ගේ ඝෝෂාව මැද කතානායකවරයාට මගහැරී ඇත. එම සංශෝධනය නැවත ඉදිරිපත් කිරීමට එකඟතාව පළකරන බව ආණ්ඩුව පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කර තිබේ.

## *රාජපක්ෂවාදීන්ගේ හැසිරීම*

පාර්ලිමේන්තුවේ අනවශ්‍ය කලබැගෑනියක් ඇතිකිරීම මගින් සමාජය තුළ හරවත් සංවාදයකට තිබූ ඉඩද අහුරා, විවාදයකින් තොරව මෙම පනත සම්මත වීමට ඉඩහරින ලද ඒනියා ඒකාබද්ධ විපක්ෂය, පනත සම්මත වීමෙන් ත්‍රිවිධ හමුදාව දඩයම් කිරීමට ඉඩ සැලසෙන බවට චෝදනා නගමින් සිටී. පනත කාරක සභා අවස්ථාවේ තිබියෙදී සංශෝධන ඉදිරිපත් කළ ඔවුන් දැන් කියන පරිදි පනත හානිකර වූයේනම් අධිකරණයට යා හැකිව තිබියෙදී එසේ කළේ නැත. පාර්ලිමේන්තු විවාදය සඳහා කථික නාමයන්ද ඉදිරිපත් කිරීමෙන් පසු ඔවුහු එය මගහැරීමට කටයුතු කළහ. එසේම පනත සම්මත වන තුරු මහත් ඝෝෂා කිරීමෙන් අනතුරුව එ.ජා.ප. නායකයින් සමග සතුටු සාමීචියේ යෙදුණහ. සැබෑ තත්වය එසේ වී තිබියෙදී ඔවුන් ජ.වි.පෙ.ට චෝදනා නගන්නේ තම බංකොලොත්භාවය වසා ගැනීම වෙනුවෙන් බව පැහැදිලිය.

## *නිතර අසනු ලබන ප්‍රශ්න*

**01. අතුරුදහන් සහතිකය (Certificare of absence) යනු කුමක්ද?**

අතුරුදහන් වූවෙකු වෙනුවෙන් දැනට ලබාගතහැකි නීත්‍යානුකූල ලියවිල්ලක් නැත. බොහෝ ඥාතීන් මේ වෙනුවට මරණ සහතික ලබාගැනීමට සූදානම්ද නැත. මෙම පනතෙන් අතුරුදහන් වූවන් වෙනුවෙන් ඥාතීන්ට අතුරුදහන් සහතිකයක් ලබාගැනීමට ඉඩ ලැබේ. එය අතුරුදහන් වූ තැනැත්තාට අදාළ සියලුම නෛතික හිමිකම් හා අනෙකුත් කටයුතු සඳහා ලබාගත හැකි ලියවිල්ලකි.

**02. නිශ්චිත කාලසීමාවක් වේද?**

නැත. ඕනෑම කාලසීමාවකට අදාළ අතුරුදහන්වීම් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කළ හැක.

**03. යුක්තිය ඉටුවේද?**

ධනේශ්වර රාජ්‍ය යාන්ත්‍රණයක් තුළ පිහිටුවනු ලබන ආයතනයකි. පූර්ණ යුක්තියක් අපේක්ෂා කළ නොහැක.

**04. නඩු පැවරීමේ බලයක් සහිතද?**

නැත. තොරතුරු සොයා බලා වාර්තා කිරීම පමණි

**05. රටේ නීතියට හා අධිකරණයට ඉහළින් පිහිටුවනු ලබන්නක්ද?**

පිහිටු වනු ලබන කාර්යාලය අධිකරණ ව්‍යුහයක් නොවේ. රටේ නීති පද්ධතියට යටත්ව ක්‍රියාත්මක වන්නකි. විමර්ශනයකින් හෙළිවන කරුණු මත කිසිවෙකුට චෝදනා ඉදිරිපත් නොවේ. වෙන වෙනම නඩු පවරා කටයුතු කළ යුතුය.

**06. විදෙස් විනිසුරුවන් සහිතද?**

පත්වීම් සිදුකරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසිනි.

**07. ත්‍රිවිධ හමුදා සාමාජිකයින් දඩයමක් සිදුවේද?**

කාර්යාලය විසින් සිදුකරනු ලබන්නේ තොරතුරු සොයාබැලීමක් පමණි. කිසිදු අධිකරණ බලයක් මෙම කාර්යාලයට නොමැත.

මෙතෙක් පැවති බොහෝ පාලනයන් තුළ අඩු වැඩි වශයෙන් නීතියට පටහැණි පැහැරගෙනයාම්, අතුරුදහන් කරවීම්, වද හිංසා පැමිණවීම් සිදුවිය. විශේෂයෙන් බලය අස්ථාවර වීමේදී පාලකයින් විශ්වාසය තබා ඇත්තේ මර්දනය වෙතය. බලහත්කාරී අතුරුදහන් කරවීම් ඔවුන්ගේ මර්දන උපකරණයකි. යහපාලන සටන්පාඨ පෙරටු කරගනිමින් බලයට පත් වත්මන් ආණ්ඩුවද පෙර පැවති ආණ්ඩුවලින් මුළුමනින්ම වෙනස් වනු ඇතැයි සිතිය නොහැකිය. වත්මන් ආණ්ඩුව මෙම පනත ගෙනඑන්නේ නොකර බැරි නිසා මිස සද්චේතනාවෙන් නොවේ. තමන් හෝ අන් කිසිවෙක් අනාගතයේ අතුරුදහන්වීමේ ඉරණමට ගොදුරු නොවිය යුතුයැයි විශ්වාස කරන, එවැනි උත්සාහයන්ට ඇති ඉඩ ඇහිරිය යුතු යැයි අධිෂ්ඨාන කරගන්නා සියලු දෙනා අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ අවශ්‍යතාව අවධාරණය කරගත යුත්තේ මේ සියලු තත්වයන් සැලකිල්ලට ගනිමිනි.

## ජනතා විමුක්ති පෙරමුණ

2016.09.05

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464/20, ස්ථානයේ පදිංචි උපුල් රන්ජන් වන මා විසින් මහරගම, පිළියන්දල පාර, නුගගහ පෙදෙස, 43/20 ස්ථානයේ පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයෙහි මුද්‍රණය කරවන ලදී.

464/20, Pannipitiya Road, Pelawatta, Battaramulla, Sri Lanka.
Tel : +94 112 785612, +94 112 786355 Fax : +94 112 786050
e-mail : jvp@jvpsrilanka.com web : www.jvpsrilanka.com, www.jvpsrilanka.lk